
# බොදු සමුළු සැරසිලි කරද්දී බීමත් පිරිසක් පහර දෙති

## හිමිවරුන් පස් නමක් ඇතුළු පහළොස් දෙනකුට තුවාලයි

බණ්ඩාරගමදී හෙට 14 පැවැත්වීමට නියමිත බොදු සමුළුවේ පෝස්ටර් අලවමින් සහ බෞද්ධ කොඩි සැරසිලි කරමින් සිටි පිරිසකට පෙරේදා (12) රාත්‍රී කිසියම් පිරිසක් පහරදීම නිසා සිවුදෙනකු රෝහල් ගත කරනු ලැබ සිටින අතර එහිදී තවත් 15 දෙනෙක් පමණ තුවාල ලැබූහ.

තුවාලකරුවන් අතර භික්ෂූන් වහන්සේලා පස් නමක්ද සිටින අතර ජාතික හෙළ උරුමයේ කළුතර දිස්ත්‍රික් අපේක්ෂක බණ්ඩාරගම වික්‍රමශිලා පරිවේණාධිපති රොටුඹ ප්‍රේමරතන හිමියන්ගේ වාහනයට බරපතළ හානි සිදුවී ඇති බව ජාතික හෙළ උරුමයේ මාධ්‍ය ප්‍රකාශක අතුරලියේ රතන හිමියෝ ඊයේ (12) පැවැති

6 වැනි පිටුවට...



බණ්ඩාරගමදී සිදුවූ පහරදීමෙන් තුවාල ලැබූ අයකුගේ ජායාරූපයක් කොළඹ [illegible] වෙරස්ගි පිහිටි අසපුවේදී පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවේදී ජාතික හෙළ උරුමයේ මාධ්‍ය ප්‍රකාශක අතුරලියේ රතන හිමියන් විසින් පෙන්වනු ලැබූ අයුරු. උඩුවේ ධම්මාලෝක, ඕමල්පේ සෝභිත, හැඩිගල්ලේ විමලසාර හා රොටුඹ ප්‍රේමරතන යන හිමිවරුද මෙහි වෙති. (ඉහළ)

බරපතළ තුවාල ලබා මින රෝහලේ ප්‍රතිකාර ලබන රෝහණ උඩුවගේ මහතා. (පහළ)



## ...බාදු සැරසිලි කරද්දී ....

1 වැනි පිටුවෙන්

පුවත්පත් සාකච්ඡාවකදී
...ශ කළහ.

බණ්ඩාරගම නගරයේ සිදුවූ
...ම ප්‍රහාරය පිළිබඳව කරුණු
...ළි කිරීම සඳහා කොළඹ
...ලයිමන් වෙරස්ති පිහිටි
...පුවේදී පැවැති පුවත්පත්
...ච්ඡාවකදී රතන හිමියෝ
...සේද පැවසූහ.

මාර්තු 14 වැනිදා බණ්ඩාරගම
...රයේ පැවැත්වෙන බොදු
...ළුව සඳහා බැනර් හා
...ස්ටර් ඇලවීමේ හා බෞද්ධ
...ඩි එල්ලීමේ යෙදී සිටි දහම්
...ල් දරුවන්, වැඩිහිටියන් හා
...ක්ෂූන් වහන්සේට කෙරුණු
...රද්දීමේදී ප්‍රේමරතන
...යන්ගේ දායකයකු වන
...හණ උඩුවගේ මහතා
...පතල තුවාල ලබා සිටිනවා.

ප්‍රේමරතන හිමියන්ගේ
...කයන් වන අනුර
...න්සේකා, නිශාන්ත සංජීව,
...රක දර්ශන යන තිදෙනාද
...ල ලබා පානදුර රෝහලට
...ළත් කර සිටිනවා.

මෙම පහරදීම කර
...බන්නේ මුහුණු ආවරණය
...ගත් බීමතින් පැමිණි පිරිසකි.
...න් බැනවදිමින්, පෝස්ටර්
...න්න පටන්ගෙන තිබෙනවා.
... ගැන විමසීමේදී නිරායුධ
...සට පන්න පන්නා පහරදී
...බෙනවා.

කඩු, පොලු මෙම පහරදීමට
...දාගෙන තිබෙනවා. යකඩ
...වලට හරහට ඇණ ගසා
...රදීම සඳහා යොදාගෙන
...ණා.

කළුතර දිස්ත්‍රික්කයේ ජාතික
...ළ උරුමයේ අපේක්ෂක
...ටුඹ ප්‍රේමරතන හිමියන්ගේ
...නයට බරපතල හානි කර
...බෙනවා.

පහරදීම අතරතුරදී පොලිස්
...ධාරීන් පැමිණ අහසට වෙඩි
... පිරිස පළවා හැර තිබෙනවා.
...දෙනකු අත්අඩංගුවට ගෙන
...බෙනවා. අනෙක් අය ඔවුන්
...ඩි නිවෙස් හැර ගොස් සිටින
... දැන් ගන්නට ලැබුණා.

ජාතික හෙළ උරුමයේ ප්‍රධාන ලේකම් උඩුවේ ධම්මාලෝක හිමියන් අපි මැරුවත් අපේ චරිත ඝාතනය කළත් දුක නැහැ. අපට ඕනෑම දෙයක් කරන්න ඒත් මේ අහිංසකයන්ට හිරිහැර කරන්න එපා. ඒ අයට කරදර කරන්නෙ ඇයි? අපි නීතිවිරෝධී කිසිම දෙයක් කරන්නෙ නැහැ. ඒක රටම දන්නවා.

අපිට මඩ ගැහුවා. නින්දා කළා. ඒවායින් අපි සැලෙන්නේ නැහැ. කම්පාවට පත් වෙන්නෙත් නැහැ. ධර්මානුකූල ලෙස අපි කටයුතු කරද්දී අපට හිරිහැර කරන්නෙ ඇයි? පිවිතුරු අරමුණකිනුයි අපි මේ කාර්යයට ඉදිරිපත්ව සිටින්නේ.

අපට විරුද්ධව මඩ පත්‍රිකා ගහපු පිරිස ගැන අපි පොලිසියට පැමිණිලි කළේ නැහැ. ඒ දිහා උපේක්ෂාවෙන් බැලුවේ.


අපි අහිංසක ලෙස, ධර්මයට අනුකූලව සියල්ල කරනවා. අපි කටයුතු කරන්නෙ ධර්ම මාර්ගයක.

ජනතා විමුක්ති පෙරමුණ, ජාතික හෙළ උරුමයට විරුද්ධ ලෙස කටයුතු කරන්නේ මන්දැයි මෙහිදී පුවත්පත් කලාවේදියකු අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ධම්මාලෝක හිමියෝ මෙසේද පැවසූහ.

ජනතා විමුක්ති පෙරමුණ ආගම, රටට බරක් කියල අදහස් කරගෙන ඉන්නෙ. නමුත් ඔවුන්ගෙ කටයුතුවලට ඔවුන් භික්ෂූන්වහන්සේලා උපයෝගී කර ගන්නවා. ඔවුන්ට තියෙන්නෙ රජයක් පිහිටුවා ගැනීමේ අරමුණ. අපට තියෙන්නෙ බුද්ධ ශාසනය හා රට රැකීමේ අරමුණක්. පරිවාස



තුවාල ලැබූ උස්වැටකෙයියාවේ ධම්මානන්ද හිමි



පහරදීමට ගෙනැවිත් තිබූ යකඩ පොලු

කාලයේ ජනතා විමුක්ති පෙරමුණ හොඳ සේවයක් ලබාදුන්නා. ඒ අය රිමෝට් කොන්ට්‍රෝල් එකක් කියලයි ඔවුන් එදා කිව්වේ. අපි ඒ ගැන සතුටු වුණා. අද ඒ තත්ත්වය නැහැ. කොල්වින්ට සිදුවූ දේ තමයි අද ජනතා විමුක්ති පෙරමුණටත් වෙලා තියෙන්නෙ. ප්‍රතිපත්ති වෙනස් වෙලා. අද සන්ධානයේ ඒකීය රාජ්‍ය ඉවත්වෙලා. මනාප පොරයට එකතුවෙලා. ආගම් පනතට අපේ හාමුදුරුවො උපවාස කරන විට ජ.වි.පෙ. කතා කළේ නැහැ. ඔවුන් බුද්ධශාසනය රකීවි කියලා විශ්වාසයක් නැහැ.

භික්ෂූන් වහන්සේ මැතිවරණයට ඉදිරිපත්වීම පිළිබඳව රාමඤ්ඤ නිකායෙන් අදහසක් ඉදිරිපත් වී තිබේ දැයි මාධ්‍යවේදියකු අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ධම්මාලෝක හිමියෝ මෙසේද කීහ.

රාමඤ්ඤ නිකායෙත් නිකායන් කීපයක් තියෙනවා. ප්‍රධාන නිකායෙන් කැමැත්ත පළ වී තියෙනවා. මල්වතු අස්ගිරි මහනායක හිමිවරුන්ගෙන් බලපෑම් කරලා නිවේදනවලට අත්සන් අරගෙන තිබුණා. දැන් උන්වහන්සේලාගෙන් නිවේදනයක් නිකුත් කරවා ගන්න පුළුවන්ද බලන්න?

මෙහිදී අදහස් දැක්වූ ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියෝ

ජනතා විමුක්ති පෙරමුණ අද තම වැඩේ හොඳින් හෝ නරකින් කරගන්නා තත්ත්වයට පත්වෙලා. ඔවුන් හරියට මූලධර්මවාදී ආගම් වගේ. පුනර්භවයක් කර්මයක් පිළිගන්නෙ නැති පිරිසක්. මාක්ස්වාදය ඔළුව උඩ තියාගෙන ඉන්නෙ.

හැඩිගල්ලේ විමලසාර හිමි:- බණ්ඩාරගම පහරදීමට සම්බන්ධ වූවන් දැන් හඳුනාගෙන සිටිනවා. අප ඔවුන්ගේ නම් ගම් හෙළි කරන්නේ නැහැ. නමුත් මෙවැනි සිදුවීම් අප හෙළාදකිනවා.

බණ්ඩාරගම වික්‍රමශිලා පරිවේණාධිපති කළුතර දිස්ත්‍රික් අපේක්ෂක රොටුඹ ප්‍රේමරතන හිමියෝ:- බණ්ඩාරගම පැවැත්වීමට නියමිත බොදු සමුළුව ප්‍රචාරක රැස්වීමක් නොවේ. ප්‍රදේශයේ ජනතාව හා පිරිවෙන් සිසුන් බොහොම සාමකාමීව, අවිහිංසකව ක්‍රියා කරද්දී මෙම පහරදීම සිදුකළා.

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාවේ පැවැත්වෙන සඟ සම්මේලනයට ජාතික හෙළ උරුමයේ සම්බන්ධයක් නොමැති බවද මෙහිදී සඳහන් කෙරිණ.

## ...න්ගෙෝ නීති ආධාර

## විමල් වීරවංශ....

වීරවංශ මහතා එවා ඇති ලිපියේ මෙසේද සඳහන්වේ.

2004.03.12 වැනි සිකුරාදා ලංකාදීප පුවත්පතේද, Daily Mirror පුවත්පතේද පළවී ඇති ඉහත සඳහන් පුවත පෞද්ගලිකවම මා හට අයුතු චෝදනාවක් ආරෝපණය කිරීමේ අරමුණින් සාදන ලද පුවතක් බව පළමුවෙන්ම සඳහන් කිරීමට ...

කරන බවත්, මා සම්බන්ධයෙන් අදාළ වන ඉහත කී දැන්වීම පළ කළ හොත් අප ගෙන එනු ලබන එබඳු දැන්වීමක් වුව බාර ගැනීමට ඔබ ආයතනයට සිදුවනු ඇති බවත්, එහිදී මම කියා සිටියෙමි. එබැවින් මා හටත් අප පක්ෂයටත් අපහාසාත්මකව කරුණු ඇතුළත් කර සකසා ඇති ඉහත කී දැන්වීම පළ කිරීමට මා විරුද්ධ නැතත් රනිල් වික්‍රමසිංහ මහතාට අදාළ

ඇත්ත වශයෙන්ම, මම ඔබට කිසි ලෙසකින්වත් තර්ජනයක් නොකළෙමි. මට අවශ්‍ය වූයේ ඉතා අයුක්තිසහගත දැන්වීමක් කෙරෙහි ඔබේ අවධානය යොමුකර, එමගින් ඔබ ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමට පමණි.

පසුව ඉහත කී දැක්වීම මාගේ කරුණු දැන්වීමෙන් පසුව බස්නාහිර පළාත තුළ බෙදා හැරෙන ඔබ පත්‍රයේ අවසන්

ප්‍රදේශවල බෙදාහැර තිබූ ඔබ පුවත්පතේ පමණක් දක්නට ලැබිණි. සෙසු සිංහල දිනපතා පුවත්පත් කිසිවක් එම දැන්වීම පළ කිරීමට බාර ගෙන නොතිබුණු බවද මම දනිමි. ඒ අනුව රනිල් වික්‍රමසිංහ මහතා සම්බන්ධවද ඒ අන්දමටම බලපාන දැන්වීමක් සකසා ඔබ වෙත මේ වන විට යොමු කර ඇතත් එය භාර ගැනීම ඔබ විසින් ප්‍රතික්ෂේප කර තිබේ.